www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ඉන්දියානු මැතිවරනය

# බීජේපීයේ "ඉන්දියාව දිදුලයි" උද්ඝෝෂනයː මායාව සහ යථාර්ථය

**The BJP's "India Shining" campaign myth and reality**

**පාවිනී සෝරා සහ ඩැනියෙල් වොරෙක් විසිනි**
**2004 මැයි 07**

හින්දු අධිපතිවාදී පාලක භාරතීය ජනතා පක්ෂය (බීජේපී) විසින් දියත් කරන ලද වත්මන් මැතිවරන උද්ඝෝෂනයේ වැදගත් අංශයක් ලෙස පවතින, ''ඉන්දියාව දිදුලයි'' නමැති වෙලඳ දැන්වීම් ප්‍රවර්ධන ක්‍රියා දාමය තුලින්, ඉන්දියානු ආර්ථිකයේ සාර්ථකත්වය පිලිබඳව හඬ තැලෙන අතර තෘප්තියට පත් සහ මනාව පෝෂිත මධ්‍යම පාන්තික ඉන්දියානුවන්ගේ සතුටු මුහුනු ප්‍රචාරය කෙරෙයි.

බීජේපීය විසින් නායකත්වය දෙනු ලබන ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධාන (එන්ඩීඒ) ආන්ඩුව, තම සාර්ථකත්වය ප්‍රදර්ශනය කරනු වස්, සියලු ප්‍රධාන රූපවාහිනී නාලිකාවන්හි ''ඉන්දියාව දිදුලයි'' වෙලඳ දැන්වීම් විසුරුවා හැරීමට පෙබරවාරියෙහි ආරම්භයේ සිට මේ දක්වා ඇමරිකානු ඩොලර් මිලියන 20ක තක්සේරුගත මුදලක් වැය කොට ඇත. මෙයට සමාන්තරව පුවත්පත් හරහා ද මෙම ප්‍රවර්ධනය සිදු කෙරෙන අතර, දිලිසෙන හා විවිධ වර්නවලින් යුත් පෝස්ටර ඉන්දියාව පුරා ඇලවෙයි.

''දීප්තියෙන් දිදුලන්නට මෙවන් හොඳ කලක් ඔබට කවදා හෝ ලැබී නැත'' යන පාඨය සහ, කහ පැහැති සාරියක් හැඳ සිනහ මුසු මුහුනින් ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදී සිටින යුවතියකගේ රුව සහිත එක් පෝස්ටරයක් මගින් වෙලඳ ප්‍රවර්ධනයේ විශේෂිත ලක්ෂනය පෙන්නුම් කෙරින. විස්තර විචාරකයන් ගනනාවක් විසින්, සමෘද්ධිමත් ඉන්දියානුවන් සහ වඩාත් මූලික සේවාවන් සඳහා මග අහිමි කෙරුනු සහ දරිද්‍රතාවේ ගිලුනු ජනගහනයෙන් අතිමහත් බහුතරය අතර පවත්නා, ඇස් නිලංකාර කෙරෙන සහ පැහැදිලි අගාධය පෙන්වා දෙනු ලැබ ඇත.

පැහැදිලිව ම, බීජේපීය මේ උත්සාහ දරන්නේ, විදේශ ආයෝජනයන් ඉහල මට්ටම්වලට නැගීමට තුඩු දුන් දශකයක ආර්ථික ප්‍රතිව්‍යුහකරනයෙන් වාසි ලබා ගත් සමාජ ස්තරයක සහයෝගය ලබා ගැනීමට යි. මෙහි දී සුවිශේෂිතව මෙම උද්ඝෝෂනය එල්ල කෙරී ඇත්තේ, රටෙහි ශීඝ්‍රයෙන් වැඩෙන තොරතුරු තාක්ෂන සහ සේවා කර්මාන්ත ක්ෂේත්‍රයෙහි වාසි අත් කර ගත්තවුන් වෙත ය. භූගෝලීය සංගතයන් විසින්, පාරිභෝගීකරනය කරන ලද ඇමතුම් මධ්‍යස්ථානවල සිට පර්යේෂනාගාර දක්වා වූ පුලුල් පරාසයක මෙහෙයුම් ඇති කරනු ලැබ තිබේ. එමගින්, සන්සන්දනාත්මක වශයෙන් සමෘද්ධිමත් ජීවන රටාවකින් යුත් මධ්‍යම පන්තියේ නව ස්තරයක් නිපැයින.

වඩාත් වැදගත් වශයෙන්, ''ඉන්දියාව දිදුලයි'' උද්ඝෝෂනය මහා ව්‍යාපාර සඳහා වෙන් වූ කෙලිබිම්කි. බීජේපී නායකයෝ, වත්මන් ඉහල ආර්ථික වර්ධන මට්ටම් සහ ඉහල නගින කොටස් වෙලඳ පොලක් දෙසට ඇඟිල්ල දිගු කරමින් ආර්ථිකමය සාර්ථකත්වයේ වගකීම පිලිබඳව උදම් අනනවා පමනක් නො ව, විවෘත වෙලඳ පොල ප්‍රතිසංස්කරන වැඩ පිලිවෙල නො අඩුව ඉදිරියට ම ගෙන යන බවට සංගත ප්‍රධානයන්ට සහ විදේශීය ආයෝජකයන්ට ශපථ වෙති.

අර්ථභාරීව, කොන්ග්‍රසය සහ ස්ටැලින්වාදී පක්ෂ--ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයි) සහ මාක්ස්වාදී ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයි[එම්]) --අන්තර්ගත විරුද්ධ පක්ෂවල ප්‍රතිචාරය වන්නේ ගොලු වත රැකීම යි. මැතිවරන කටයුතු සඳහා, ලජ්ජා සහගතව රජයේ සම්පත් යොදා ගෙන ඇතැයි ඔවුහු ''ඉන්දියාව දිදුලයි'' උද්ඝෝෂනය විවේචනය කරති. මේ සමග ම, කෝටි සංඛ්‍යාත ඉන්දියානුවන් මුහුන දී සිටින දරිද්‍රතාවේ විවිධ පැති මතු කර පෙන්වන ඔවුහු මහජනතාවගේ ජීවන තත්වය නගා සිටුවන බවට හිස් පොරොන්දුවලින් ශපථ වෙති.

නමුත් මෙම එක ම පක්ෂයක් වත් කවර හෝ විකල්ප පිලිවෙතක් ඉදිරිපත් නො කරයි. 1990 ගනන් මුල දී ඉන්දියානු ආර්ථිකය විදේශ ආයෝජන සඳහා විවෘත කර දීම සම්බන්ධයෙන් වගකිව යුත්තේ කොන්ග්‍රසය යි. ඔවුන්ගේ උද්ඝෝෂනයේ දී මතු කර පෙන්වීමට උත්සාහ කල කරුන වූයේ මෙය යි. ''වාම'' සන්ධානයේ කොටසක් ලෙස බටහිර බෙංගාලයේ සහ කේරලයේ බලය දැරූ සීපීඅයි[එම්] පක්ෂය, එම ප්‍රාන්ත රාජ්‍යයන් සඳහා ආයෝජන ආකර්ෂනය කර ගනු වස් අනුගමනය කලේ සමාන පිලිවෙත් ය.

තම විවේචනවල දී, මෙම පක්ෂ සියල්ල ම, ''ඉන්දියාව දිදුලයි'' උද්ඝෝෂනය යටින් පවත්නා

කේන්ද්‍රීය මිථ්‍යාවට සම්මාදම් වෙයි: ආර්ථික වර්ධනයට එක ම මග වන්නේ වෙළඳ පොළ ප්‍රතිව්‍යුහකරනය යි; මෙම වර්ධනය මගින් වැඩෙන ජනගහනයට රැකියා හා හොඳ ජීවන තත්වයන් සම්පාදනය කෙරෙයි; මහ ජනතාවගේ දුගී ම ස්තරයන් කරා පවා මෙම ආර්ථික ප්‍රතිලාභ අවසානයේ දී කාන්දු වෙයි. මහජනතාවගේ ජීවන තත්වයන් වර්ධනය කරනවා වෙනුවට, කොන්ග්‍රස් සහ එන්ඩීඒ ආන්ඩු දෙක ම දශකයක් තුල ක්‍රියාත්මක කල ආර්ථික ප්‍රතිව්‍යුහකරන තුලින් සිදු වූයේ ඉන්දියාවේ දුප්පතුන් සහ පොහොසතුන් අතර පවත්නා ගැඹුරු සමාජ අගාධය පුලුල් කිරීම යි.

භූගෝලීය සංගතයන්ගේ ලාභ ශ්‍රම ඉල්ලීම්වලින්, ඉන්දියානු සමාජ ස්තරයක් වාසි ලැබූ බැව් සත්‍යයකි. ලොව තෙ වන විශාලතම ආධ්‍යාපනික ශ්‍රමය සංකේන්ද්‍රනය වී ඇත්තේ ඉන්දියාව තුල වන අතර, එක්සත් ජනපදයෙහි හා යුරෝපයෙහි වැය කරන මුදලෙන් දහයෙන් එකක ප්‍රමානයකට මෙම ශ්‍රම ශක්තිය ඉන්දියාව තුල දී මිලයට ගත හැකි ය. එහෙත් ඉන්දියානු පදවලින් කතා කල හොත්, විදේශීය සමාගම්වල සේවයේ නියුතු තරුන රැකියාධාරීන් ලැබූ ආර්ථික ප්‍රතිලාභයන් සැලකිය යුතු ය. ඔවුහු රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකු උපයන මුදල මෙන් පස් ගුනයක් උපයති.

දකුනු ඉන්දියාවේ බැංගලෝරයේ, නෝර්විච් සංගම් ඇමතුම් මධ්‍යස්ථානයේ පාරිභෝගික උපදේශිකා, 22 හැවිරිදි සම්පත් මෙනෙවිය ප්‍රීති ප්‍රමෝදයෙන් බීබීසීයට මෙසේ පැවසුවා ය: ‘‘වැටුප නියත වශයෙන් ම පුදුම එලවනසුලු යි. .. ඇමතුම් මධ්‍යස්ථාන, ඉන්දියාව තුල ශීඝ්‍රයෙන් වැඩෙන කර්මාන්තවලින් එකක්. ඔබ හැකියාවන් ප්‍රදර්ශනය කරන්නේ නම් විශාල මුදලක් උපයා ගත හැකි යි.’’ ඇගේ වැටුප, බ්‍රිතාන්‍යයේ ඇය හා සමාන රැකියාවක් කරන්නෙකුගේ වැටුපෙන් හයෙන් එකක් වුව ද, එය ඉන්දියානු ගුරුවරයෙකුගේ වැටුප මෙන් දෙගුනයක් වන අතර පූර්න සුදුසුකම්වලින් යුත් ඉන්දියානු වෛද්‍යවරයෙකුගේ වැටුපට ආසන්න වශයෙන් සමාන වේ.

නමුත් එවන් රැකියා ලබා ගත හැකි ඉන්දියානුවන් සංඛ්‍යාත්මකව කුඩා ය. තොරතුරු තාක්ෂන ක්ෂේත්‍රය පුරා රැකියාවල යෙදෙන්නන්ගේ සංඛ්‍යාව ලක්ෂ කීපයකට සීමා වේ. මෙම රැකියා සඳහා තරගය උත්සන්න වන අතර ඉසිලීමට ඇති වැඩ ප්‍රමානය අධික හා පීඩාකාරී වේ. ඇමතුම් මධ්‍යස්ථානවල වාර්ෂික පිරිවැටුම සියයට 50ක් තරම් ඉහල අගයක් වනු ඇතැයි තක්සේරු කෙරී ඇත. තව දුරටත් පැවසුව හොත්, මෙම නව කර්මාන්තයන් මගින් ඉන්දියානු මධ්‍යම පන්තියේ කොටසක් සමෘද්ධිමත් වුව ද, ආන්ඩුවේ සේවාවන් සහ ව්‍යවසායන් පුද්ගලීකරනය කිරීම හා ප්‍රමානයෙන් කුඩා කිරීම නිසා රැකියා අහිමි වීමෙන් සහ මහජන ශුභසාධන ක්ෂේත්‍රයන්හි ඇති වූ දැවැන්ත කප්පාදුවලින් අනෙකුත් මහජනයා තදබල ලෙස පහර කමින් සිටිති.

## සමාජ ව්‍යසනය

කම්කරු පන්තිය තුල සහ ජනගහනයෙන් බහුතරයක් ජීවත් වන ගම්බද පලාත් තුල සමාජමය සංසටනය වඩාත් දරුනු වෙමින් පවතී. *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත මාර්තු මාසයේ දී මෙසේ සටහන් කලේ ය: ‘‘බිලියනයකට අධික ඉන්දියානු ජනගහනයෙන් මේ තාක් ගම්බදව ජීවත් වන බහුතරය, තමා වෙතට මෙම සම්පත් ගලා ඒමක් පිලිබඳව කිසි දිනක අසා නොමැති අතර, ඒවායේ වාසි ද භුක්ති විඳ නොමැත. ඉන්දියාවේ විරැකියා ප්‍රශ්නය -- මෙය එක්සත් ජනපදය තුල ප්‍රතිශතයට වඩා ඉතා ඉහල ය-- පසු ගිය දශක ගනනාව තුල පැවති ඉහල ම අගය කරා පැමින ඇති බැව් බොහෝ ආර්ථික විද්‍යාඥයෝ පවසති. නිල වාර්තාවලට අනුව, ගිය වසරේ රැකියා බලාපොරොත්තු වූවන්ගේ සංඛ්‍යාව මිලියන 40ක් ද විරැකියා ප්‍රතිශතය සියයට 7ක් ද වන නමුත්, නියම අගය එමෙන් තෙ ගුනයක් විය යුතු බැව් ආර්ථික විද්‍යාඥයන්ගේ මතය යි.’’

භූගෝලීය වශයෙන් තරගකාරී නො වන කර්මාන්තවල සේවයේ නියුතුව සිටි මිලියන සංඛ්‍යාත කම්කරුවන්ට රැකියා අහිමි විය. තව දුරටත් පැවසුව හොත්, රටේ කම්කරු නීති වෙනස් කිරීම හේතුවෙන් හාම්පුතුන්ට කම්කරුවන් රැකියාවලින් පලවා හැරීම වඩාත් පහසු කෙරුනු අතර, මෙම ක්‍රියා දාමය වඩවඩාත් පහසු කිරීම සඳහා එන්ඩීඒ ආන්ඩුව මාන බලමින් සිටියි. මෙහි ප්‍රතිඵලය වූයේ ඉන්දියාවේ සාම්ප්‍රදායික කර්මාන්ත මධ්‍යස්ථාන විනාශභාග් වීම යි.

‘‘ඉන්දියාව දිදුලයි’’ උද්ඝෝෂනයෙහි බොරුව හෙලිදරව් කිරීම සඳහා කවරයේ කතාව කැප වූ, මාර්තු 12 වන දා *ෆ්‍රන්ට් ලයින්* සඟරාවේ ලිපියකින්, වර්තමානයේ දී මුම්බායි නමින් නිල වශයෙන් හැඳින්වෙන බොම්බාය තුල ආර්ථික ප්‍රතිව්‍යුහකරන මගින් ඇති කෙරුනු බලපෑම ඉස්මතු කොට තිබින. මෙම නගරය, රෙදිපිලි, රසායන ද්‍රව්‍ය, ඖෂධ වර්ග සහ ඉංජිනේරු කර්මාන්තය සඳහා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක විය. නමුත් ‘‘‘නව ආර්ථිකයේ’ ගොදුරු’’ යන හිසින් යුත් එම ලිපිය මෙසේ විස්තර කරයි.

‘‘පසු ගිය දශකය තුල, මිලියන ගනනකට රැකියා අහිමි කරමින්, කර්මාන්ත ප්‍රවනතාව නිෂ්පාදන ක්ෂේත්‍රයේ සිට සේවා ක්ෂේත්‍රයට මාරු විය. දරුනු ම පහර වැදුනේ මුම්බායිහි මෝල්වල වැඩ කල කම්කරුවන්ට ය. 1981දී ලක්ෂ 2.5ක් (250,000ක්) වූ බලගතු කම්කරු බලකාය අද වන විට 20,000 දක්වා පහල බැස ඇත. වරෙක මෙහි රෙදිපිලි කර්මාන්තය නගර ආර්ථිකයේ කොඳුනාරටිය වූ අතර, දහස් සංඛ්‍යාත ආගමනිකයන්ගේ බලාපොරොත්තුව විය. අද දින එම මෝල් බොහොමයක් වසා දැමී ඇත්තේ කම්කරුවන්ට ලැබිය යුතු දීමනා පවා නො දෙමිනි.’’

සේවා කොන්දේසි ද නාටකාකාර ලෙස වෙනස් විය. ‘‘1960 ගනන්වල මුල දී, මුම්බායිහි රැකියාවලින් සියයට 51ක් සංකේන්ද්‍රනය වී තිබුනේ සංවිධානගත නිෂ්පාදන ක්ෂේත්‍රයේ ය. ඒවා තුල කම්කරුවන්ගේ රැකියා ස්ථිර තත්වයේ වූ අතර, නිවාඩු සහ අර්ථසාධක

අරමුදල් වැනි වාසි සහතික කෙරී තිබින. අද දින මුම්බායිහි කම්කරු බලකායෙන් සියයට 65ක් වැඩ කරන්නේ කොන්ත්‍රාත් පදනමේ ය.''

ජනගහනයෙන් තුනෙන් දෙකකට නිවහන වූ ගම්බද ප්‍රදේශයන් ද ව්‍යසනයට පත් විය. ආර්ථික ''ප්‍රතිව්‍යුහකරනය'' යනුවෙන් අදහස් කෙරුනේ, වාරිමාර්ග, පොහොර, විදුලිය සහ අනෙකුත් කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා රජයෙන් සැපයූ ආධාර මුදල්වල සහ අනුග්‍රාහකත්වයේ දැවැන්ත කප්පාදු ය. අස්වැන්න පහත වැටීමෙන් සහ මිල පහත වැටීමෙන් දැවැන්ත ලෙස නයබරින් මිරිකී, මේ උභතෝකෝටිකයෙන් ගොඩ එන මාවතක් නුදුටු ගම්බද ගොවීහු විශාල සංඛ්‍යාවක් සිය දිවි නසා ගත්හ.

ධාන්‍ය වර්ග හා එලවලු වැනි මූලික ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවත්වා ගෙන ගිය රාජ්‍ය ඒකාධිකාරය අහෝසි කිරීම මිල ඉහල යාමට තුඩු දුන් අතර, ඉන් ධනවත් ගොවී අතලොස්සක් වාසි අත් කර ගත්හ. නමුත්, මෙම මිල ඉහල යාම මගින් පාරිභෝගික ජනතාවට  බලගතු ප්‍රහාරයක් එල්ල විය. රාජ්‍ය බැංකුවලින් ලබා දුන් නය ආපසු අය කර ගැනීම සඳහා යොදන බලගතු පීඩනය මධ්‍යයේ, ඉහල පොලී අනුපාතවලින් යුත් නය ලබා ගැනීම සඳහා තල්ලු කෙරුනු බහුතරයක් ගොවි ජනතාවට මින් ලැබුනු අවකාශයන් ඉතා කුඩා ය.

ගම්බද දුගීන්ගේ ජීවිත එදිනෙදා කෙසේ හෝ පන ගැට ගසා ගන්නා තත්වයට ඇද වැටී ඇත. සාගින්න හා සාගතය පුලුල් ලෙස ව්‍යාප්ත ය. මේ වසරේ, කලට වේලාවට මෝසම් වැසි ලැබුන ද -- මෙය ඉහල ආර්ථික වර්ධනයට එක් හේතුවකි -- රටේ බොහෝ ප්‍රදේශ මෑත වසරවල දී නියඟයෙන් දැඩි ලෙස පීඩා වින්දේ ය.

*ෆ්‍රන්ට් ලයින්* සඟරාව මහාචාර්ය උත්සා පැට්නේක් සිය අධ්‍යයනයන්ගෙන් එලඹි නිගමන මෙසේ උපුටා දක්වයි: ''අද දින ඉන්දියානු පවුලක වාර්ෂික ධාන්‍ය පරිභරනයේ සාමාන්‍යය, යන්තම් පස් වසරකට පෙර අගයට වඩා කිලෝග්‍රෑම් 100කින් පමන අඩු වී ඇත. (එය) ඉන්දියානු ඉතිහාසයේ පසු ගිය සියවස තුල කිසි දිනෙක නුදුටු අතිවිශාල පහල වැටීමකි.'' පැට්නේක්ට අනුව 2002-2003 වසර සඳහා නියම ඒක පුද්ගල ධාන්‍ය ආහාර සුලබතාව, මිලියන 1.5ත් මිලියන 3ත් අතර මිනිසුන් සංඛ්‍යාවක් මිය ගිය බවට තක්සේරු කර ඇති 1943 බෙංගාල දුර්භික්ෂ සමයේ තිබූ අගයට වඩා පහල අගයකි.

ලොව මන්දපෝෂිත ළමුන්ගෙන් වැඩි ම සංඛ්‍යාව සතු කර ගෙන සිටින ඉන්දියාව ලොව සාගින්නේ සිටින මිනිසුන්ගෙන් අඩක පමන නිවහන බවට පත්ව ඇත. වයස අවුරුදු 15ත් 49ත් අතර ගර්භනී ගැහැනු දහ දෙනෙකුගෙන් නව දෙනෙක් ම මන්දපෝෂනයෙන් සහ රුධිර ඌනතාවෙන් පෙලෙති. වයස අවුරුදු පහට අඩු ලමුන්ගෙන් අඩක් ම පාහේ සාමාන්‍ය හෝ දරුනු මන්දපෝෂනයෙන් හෝ කුරු බවින් පෙලෙති.

ඉන්දියානු ආර්ථිකයේ ඉහල නැග්මක් සිදු වී තිබිය දී පවා එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන අංකනය අනුව එහි ස්ථානය 124 සිට 127 දක්වා රූටා ඇත. ආන්ඩුවේ වියදම් කපා හැරීම්, සෞඛ්‍යය සහ අධ්‍යාපනය ඇතුලු අත්‍යවශ්‍ය සේවාවන් කෙරෙහි ද පිරිසුදු ජලය, මාර්ග සහ විදුලි බලය වැනි මූලික යටිතල පහසුකම් කෙරෙහි ද දැඩි ලෙස බලපා ඇත. දල දේශීය නිෂ්පාදිතයෙන් සෞඛ්‍යය සඳහා වෙන් කෙරෙන මුදල 1991-92 වසර සඳහා සියයට 1.4 පැවති අතර 2001-02 වසර සඳහා එය සියයට 0.9 දක්වා පහත වැටී ඇත. පුද්ගලික සැපයුම්කරුවන් වෙතට යාමට වඩවඩාත් බල කෙරෙන තතු තුල ගම්බද පවුල්වල නයබරෙහි දෙවනුව වේගවත්ව වැඩෙන කොටස, සෞඛ්‍යය සඳහා වැය වන මුදල යි.

නො ඉවසිය හැකි දරිද්‍රතාව සහ චිරකාලීන විරැකියාව හෝ අර්ධ රැකියාමය තත්වය විසින් මිලියන සංඛ්‍යාත මිනිසුන් වැඩක් සොයා නගරවලට තල්ලු කෙරී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස මිලියන 30ක ජනයා ප්‍රධාන ඉන්දියානු නගර වටා පීඩාකාරී පැල්පත්වල ජීවත් වෙති.

## ආර්ථික හිදුරතාව

''ඉන්දියාව දිදුලයි'' එල්ල කෙරී ඇත්තේ දරිද්‍ර මහජනතාව වෙත නො වේ. සියල්ලට ම වඩා, රට තුලට විදේශ ආයෝජන ගලා ඒමේ වර්ධනය නිසා සහ ප්‍රධාන සේවාවන් සඳහා භූගෝලීය මධ්‍යස්ථානයක් බවට ඉන්දියාව පත්ව ඇතැයි යන හැඟීම නිසා පාලක කවයන් තුල ඇති වී තිබෙන වත්මන් ශුභවාදී මනෝගතියට එමගින් ආමන්ත්‍රනය කෙරේ. පසු ගිය වසරේ ආර්ථික වර්ධනය සියයට 7ක් වන අතර ලබන වසරේ මෙම අගය සියයට 8ක් ලෙස පූර්වාපේක්ෂිත ය -- මෙය දෙ වනු වන්නේ චීනයට පමනි.

මූල්‍ය කවයන් තුල පවත්නා මනෝගතීන් ප්‍රකාශයට පත් කරමින් මුම්බායිහි බාක්ලේස් බැංකුවේ අමිත් බන්සාල් වරෙක මෙසේ පැවසීය: ''මැතිවරනය වටා පවත්නා අවිනිශ්චිත භාවය තුරන් වනු ඇත, ආයෝජනය වඩාත් පහසු වනු ඇත. මැයි මාසය, විදේශ ආයෝජන රට තුලට ගලා ඒම සම්බන්ධයෙන් සහ බැංකු සම්බන්ධයෙන් ගත් කල ගැට්ටට ම පිරෙන මාසයක් බවට පත් වනු ඇත.''

අප්‍රේල් 23 දා වන විට, මේ වසර තුල දී පමනක් ඉන්දියානු කොටස් වෙලඳ පොලට ඇමරිකානු ඩොලර් බිලියන 4.1ක් ගලා ආවේ ය. මෙය ගිය වසරේ සම්පූර්න අගයෙන් තුනෙන් දෙකකට ඉතා ආසන්න ය. *බ්ලූම්බර්ග්.කොම්* සමාගමට අනුව, ඉන්දියානු රුපියල ඩොලරයට එරෙහි ලොව වඩාත් පරිසාධිත විනිමය අතරින් තෙ වන ස්ථානය ගන්නා අතර ඉන්දියාව චීනයට පසු වඩාත් පරිසාධිත ආර්ථිකය යි.

කෙසේ නමුත්, මෙම අදහස් මගින්, පාලක ප්‍රභූවක් තමාගේ ම සීමිත සාර්ථකත්වයන්ගෙන් උමතු වී ඇති බැව් පිලිබිඹු වේ. ලෝක ජනගහනයෙන් හයෙන් එකක් ජීවත් වන රටක් වුව ඉන්දියාව මෙතෙකුදු දායක වන්නේ ලෝක ආර්ථිකයෙන් සියයට 2ක් වූ ඉතා කුඩා කොටසකට පමනක් වන අතර, ලෝක වෙලඳාමේ එහි පංගුව සියයට 1ටත් වඩා අඩු ය. තොරතුරු

තාක්ෂන ලෝකයේ පවා, මෙම රට යුරෝපයේ සහ එක්සත් ජනපදයේ තාක්ෂනය සහ වෙලඳ පොල මත යැපෙන සාපේක්ෂ වශයෙන් සුලුතර ක්‍රීඩකයෙකි. ඉන්දියානු ආර්ථිකයේ ඉරනම, මෙම ප්‍රධාන ආර්ථිකයන්ගේ අවිනිශ්චිත අනාගතය සමග වඩවඩාත් බැඳෙමින් පවතී.

වත්මන් සංඛ්‍යා ලේඛන මගින් පෙන්නුම් කෙරෙන්නේ, 1990 ගනන්වල අග භාගයේ ආසියානු ආර්ථික අර්බුදයට පෙර තිබූ ආකාරයේ බිඳෙනසුලු ආර්ථික බුබුලක් ඉන්දියාව තුල වැඩෙන බව යි. ආර්ථිකයේ අනෙකුත් ක්ෂේත්‍රයන් එක තැන පලවන අතරතුර, දැවැන්ත ලාභ සහිත තොරතුරු තාක්ෂනය හා සම්බන්ධිත ක්ෂේත්‍රයන්ට සහ ඉන්දියානු කොටස් වෙලඳ පොලේ සමපේක්ෂනයට ආයෝජන ගලා ඒ. දුගී යටිතල පහසුකම්, ප්‍රමානවත් නො වූ සංගත නීති මගින් සහ භූගෝලීය සංගත විසින් දැරිය නො හැකි රතු පීත්තපටියක් සේ සැලකෙන කම්කරු නීති, තීරු බදු, ආන්ඩුවේ නීතිරීති සහ නිලධාරිමය දූෂන මගින් විදේශීය ආයෝජන අවහිර කෙරේ.

ධනේශ්වර වෙලඳ පොලේ තර්කනය දයා විරහිත ය. 1980 ගනන්වල සහ 1990 ගනන්වල සිදු වූ භූගෝලීයකෘත නිෂ්පාදනයේ දැවැන්ත ප්‍රසාරනය මගින්, ලොව වටා අනෙකුත් රටවල්වලට මෙන් ම ඉන්දියාවට ද, පූර්වයෙන් පැවති ජාතික ආර්ථික පරිපාලන පද්ධතිය කඩා බිඳ දැමීමටත් විදේශ ආයෝජනයන් සඳහා දොරගුලු විවර කර දීමටත් බල කෙරින. මැතිවරනයෙන් ජයග්‍රහනය කරන්නේ කවුරුන් වුව ද, පිහිටුවනු ලැබෙන නව ආන්ඩුව, ''ජාත්‍යන්තරව තරගකාරී වීම'' දිගට ම පවත්වා ගෙන යාම සඳහා සහ තව දුරටත් විදේශ ප්‍රාග්ධනය ආකර්ෂනය කර ගැනීම සඳහා, ආර්ථික ප්‍රතිව්‍යුහකරනයේ ඉදිරි පියවරයන් ගැනීමටත් මහජනතාවගේ සමාජමය තත්වය තව දුර විනාශ කිරීමටත් තල්ලු වනු ඇත.

''ඉන්දියාව දිදුලයි'' උද්ඝෝෂනයේ වාටුමය වෙලඳ දැන්වීම් මගින්, පුපුරනසුලු දේශපාලන ප්‍රතිවිපාක ගෙන දිය හැකි, දුප්පතුන් හා පොහොසතුන් අතර ගැඹුරු වන සමාජ භේදනය වසන් කල නො හැකිය. ධනේශ්වරය මේ දක්වා, විශේෂයෙන් ම බීජේපීය, මහජනතාව භේදභින්න කිරීම සඳහා වාර්ගිකවාදය මත සහ, කම්කරු පන්තියේ අවශ්‍යතා නැවතනැවතත් පාලක පන්තියේ ඒ හෝ මේ කොටසට යට කර දැමූ සීපීඅයි හා සීපීඅයි[එම්] වැනි විවිධ ''වාම'' පක්ෂ මත රැඳී ඇත. අවශ්‍ය කෙරී ඇත්තේ, සමස්ත උප-මහාද්වීපයේ සහ ලොව වටා වෙසෙන කම්කරුවන්ගේ එකමුතුවෙන්, තමාගේ ම ඓතිහාසික අවශ්‍යතා සඳහා සටන් කරන, කම්කරු පන්තියේ දේශපාලනික ස්වාධීනත්වය මත පදනම් වූ සමාජවාදී සමානතා පක්ෂයක් ගොඩ නැගීම යි.

© www.wsws.org